වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2011

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE
UNIVERSITY OF PERADENIYA

වාර්ෂික වාර්තාව

2011

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

තැ.පෙ.55, පරණ ගලහා පාර

පේරාදෙණිය, ශ්‍රී ලංකාව

දු.ක: 081-2389205,2385517,2388692,2388203

ෆැක්ස්: 081-2388318

වෙබ්: www.pgia.ac.lk

පටුන

1.	දැක්ම	01
2.	මෙහෙවර	01
3.	අධ්‍යක්ෂකගේ සමාලෝචනය	02
4.	සම්පත් හා සිසුන්	05
5.	දේශීය සිසුන්	05
6.	විදෙස් සිසුන්	05
7.	අධ්‍යයන කාර්ය මණ්ඩලය	06
8.	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	06
9.	පර්යේෂණ. නව නිපැයුම් හා ප්‍රකාශණ	06
10.	වැඩසටහන්. සම්මන්ත්‍රණ හා වැඩමුළු	07
11.	ලබාගත් සම්මාන	07
12.	ආරම්භ කළ නව පාඨමාලා	07
13.	පුනරාවර්තන වියදම්	08
14.	ප්‍රාග්ධන වියදම්	08
15.	ව්‍යාපෘති (දේශීය/විදේශීය ආධාර ලද)	08
16.	ව්‍යාපෘති -වියදම(දේශීය/විදේශීය ආධාර ලද)	08
17	මූල්‍ය ප්‍රගතිය(වියදම)	09
18.	මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කළ ආදායම්)	09
19.	මුදල් කාර්ය සාධන විශ්ලේෂණය -2011	09
20.	2011 වසරේ ලැබුණු යටිතල පහසුකම්	09
21.	මෙම වාර්තාවට අදාළ වෙනත් විස්තර/කාර්ය සාධනය	09
22.	විගණන වාර්තාව හා පිළිතුරු වාර්තාව	10

1. දැක්ම

රජයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ හා ගෝලීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂි කර්මාන්තය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපන, පර්යේෂණ හා සමාජ කටයුතු යන අංශයන්හි විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම.

2. මෙහෙවර

කෘෂි කර්මාන්තය හා ඒ හා සම්බන්ධ සම ක්ෂේත්‍රයන්හි ජාතික සංවර්ධනයක් ඇතිකිරීම උදෙසා හැකියාවන්ගෙන් පරිපූර්ණ නව අදහස්වලින් හෙබි කැපවූ පුද්ගලයන් පිරිසක් බිහිකිරීම සඳහා න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙමින් පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ හා සමාජ කටයුතු යන අංශයන්හි ජාතික වශයෙන් හා කලාපීය වශයෙන් පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

3. අධ්‍යක්ෂකගේ සමාලෝචනය

I. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ ප්‍රථම ආයතනය වශයෙන් කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1975 වසරේ ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදි. කළමනාකරණ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ පිහිටුවන ලද මෙම ආයතනයේ ප්‍රධාන අරමුණ වනුයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනය මෙරට තුළදීම ලබාදීමෙන් රටතුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන කෘෂිකාර්මික අංශයට මනා පුහුණුවක් ලද විද්‍යාත්මක දැනුමෙන් හෙබි පුද්ගලයන් පිරිසක් දායාද කිරීමයි. පුරා වසර 35කට අධික කාලයක් මෙම ආයතනය මගින් එම ජාතික අවශ්‍යතාව ඉටුකර ඇති අතර එය මෙරට මෙන්ම කලාපයේ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය ලෙස පිබිදී ඇත.

වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු 2011 ඔක්තෝබර් මස 21වන දින අධ්‍යක්ෂධුරයෙන් විශ්‍රාම ගන්නා ලද මහාචාර්ය ඒ.එල්.ටී. පෙරේරා මහතා විසින් ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනගි සේවාවක් ඉටුකරන ලදි.

මහාචාර්ය කොලින් එන්. පීරිස් මහතා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හත්වන (7) අධ්‍යක්ෂවරයා වශයෙන් 2011 ඔක්තෝබර් මස 23 වන දින සේවා ආරම්භ කරන ලදි. කෘෂිකර්ම පීඨයේ බෝග විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කරන ඔහු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මකවන තත්ව සහතික කිරීම් හා පැවරීම් මණ්ඩලයේ වැඩබලන අධ්‍යක්ෂවරයා වශයෙන්ද සේවය කරයි.

ශිෂ්‍ය ලියාපදිංචියේදී කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පසුගිය වසර 35 ක කාලය තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. 2011/2012 අධ්‍යයන වර්ෂයේදී විවිධ අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන් 411 ක් ලියාපදිංචි වී ඇත. ඔවුන් අතුරෙන් සිසුන් 320 ක් විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහාද, 29 දෙනෙකු ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහාද, 24 දෙනෙකු දර්ශණපති උපාධිය සඳහාද, 15 දෙනෙකු දර්ශණශූරී උපාධිය සඳහා හා 12 දෙනෙකු ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහාත් ලියාපදිංචි වී සිටිති. මීට අමතරව 11දෙනෙකු අනියම් සිසුන් වශයෙන්ද ලියාදිංචිවී සිටිති.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2011 වර්ෂයේදී උපාධි 235 ක් ප්‍රදානය කොට ඇත. ඒ අතරින් විද්‍යාපති උපාධි 153 ක්, දර්ශණපති උපාධි 14 ක් දර්ශණශූරී 2 ක් හා ව්‍යාපාර පරිපාලනපති උපාධි 28 ක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා 38 ක් වේ.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාවට පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය, කලා, විද්‍යා, වෛද්‍ය ආදි සියලුම පීඨවලට අයත් උපාධිධාරීන් ඇතුලත් වේ. විදෙස් සිසුන් විශාල සංඛ්‍යාවක් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා සාර්ථකව අවසන් කොට ඇත. ආයතනය සාර්ක් රටවල සිසුන්ට සහනදායී මිලගණන්වලට අධ්‍යයන පාඨමාලා පිරිනමන අතර එවැනි සහන අවශ්‍ය වෙනත් සිසුන්ට ද අඩු මිලගණන්වලට අධ්‍යයන පාඨමාලා ප්‍රදානය කරනු ලබයි. මේවනවිටත් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි අවසන් කළ සිසුන් අතරට බංගලාදේශය, ඉන්දියාව, චීනය., නේපාලය, මියන්මාරය හා ඕමානය යන රටවලට අයත් සිසුන් ඇතුලත් වේ.

23 වැනි වාර්ෂික සමුළුව 2011 නොවැම්බර් මස 17 – 18 යන දිනවල පවත්වන ලදි. කෘෂි ජීව විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ කථිකාචාර්ය ආර්.පී. කරුණාගොඩ මහත්මිය එහි සම්බන්ධීකාරකවරිය ලෙස කටයුතු කළාය. මෙම සමුළුව සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ

පත්‍රිකා 60 ක් අතුරින් තෝරා ගත් පත්‍රිකා 31ක් හා පෝස්ටර් පත්‍රිකා 12ක් සැසි වාර හතක් යටතේ ඉදිරිපත් කරන ලදී. ඒ අතුරින් ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාළ ඇගයීම් මණ්ඩලයක පුළුල් අධ්‍යනයකට ලක් කිරීමෙන් අනතුරුව මතු දැක්වෙන පර්යේෂණ පත්‍රිකා සඳහා ත්‍යාග පිරිනමන ලදී.

2011 – හොඳම පර්යේෂණ පත්‍රය

එස්.එම්.ආර්. සමරකෝන් මයා

2011 – සැසි අනුව හොඳම පර්යේෂණ පත්‍රය		**ජයග්‍රහනය ලැබුවේ**
I : ජීව රසායන විද්‍යාව හා ආහාර විද්‍යාව	-	ජේ.ඩී. කොට්ටාවආරච්චි මයා
II : සත්ව හා ජලජ විද්‍යාව	-	එස්.එම්.ආර්. සමරකෝන් මයා
III : පාංශු. ජල හා අවකාශ දත්ත කළමණාකරණය	-	ඒ. සුදර්ශිණි මිය
IV : අණුක ජීව විද්‍යාව හා ජාන පරිහරණය	-	එච්.ඩී.ඩී. බන්දුප්‍රිය මයා
V : කෘෂි ආර්ථික හා ව්‍යාප්ති	-	එම්.ජ්.සී.එස්.එස්. ප්‍රනාන්දු මයා
VI : මල් වගාව හා ශාක වර්ගීකාරක	-	ඩී.පී. කරුණානන්ද මිය
VII : ශාඛ ආරක්ෂණය හා ශෂ්‍ය විද්‍යාව	-	එම්. ඥාණකුමාර් මයා
VIII: පෝස්ටර් ඉදිරිපත් කිරීම	-	ආර්.එම්.එන්.එස්. සුගතපාල මිය

ආචාර්ය ඒ.ඩබ්ලිව්.ආර්. ජෝකින් අනුස්මරණ ත්‍යාගය

(GPA - 4.00 ක් ලබාගත් ශිෂ්‍යයාට පිරිනමන ලදී.)

1. ඒ.එම්.කේ.සී.කේ. අබේකෝන් මිය - බෝගවිද්‍යා අධ්‍යයන මණ්ඩලය
2. ඊ.ජී.ජී. එස්. අමරවංශ මිය - පාංශු විද්‍යා අධ්‍යයන මණ්ඩලය

කෘෂි පර්යේෂණ ආයතනය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා හා කෘෂි කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රයන්ට අදාල වැඩ සටහන් සඳහා නව සහ වඩාත් උචිත දැනුම් හා නිපුණතා වැඩි දියුණු කිරීම් උදෙසා අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලබයි.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඉගැන්වීමේ හා පර්යේෂණ කාර්ය පිළිබඳ හසළ පළපුරුද්දකින් යුත් විශිෂ්ට ගණයේ ආචාර්යවරුන් තුන්සිය දෙනෙකුට (300) වැඩි පිරිසක් අයත්වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයට අයත් වන අතර අනෙකුත් සියලු අය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෙනත් පීඨවලට. වෙනත් විශ්වවිද්‍යාලවලට. රාජ්‍ය දෙපාර්තුමේන්තුවලට. පර්යේෂණ ආයතනවලට. සංස්ථා. පුද්ගලික අංශයේ ව්‍යාපාරවලට. ජාත්‍යන්තර ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත්වූවෝ වෙති.

රටේ පොදු ජනතාවගේ යහපත අරමුණු කර ගනිමින් ගත් ප්‍රායෝගික පුහුණුව. නවීන දැනුම හා අපගේ පිරිපුන් ජෛව විවිධත්වයන් හා සබැඳි සම්ප්‍රදායික ශිල්පීය ඥානය හා මුසුවූ නවීනතම ශිල්පීය ක්‍රම තුලින් පශ්චාත් උපාධි ධාරීන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා කෘ.වි.ප.උ.ආයතනය නිරන්තරව උත්සාහ කරනු ලැබේ. ගුණාත්මක භාවය අරමුණු කර ගනිමින් කෘ.වි.ප.උ ආයතනය නිරතුරුවම එහි පාඨමාලා සංශෝධනය කිරීමටත්. ජාතික සහ ජාත්‍යන්තර, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ කෘෂිකාර්මික ක්ෂෙත්‍ර සඳහා නව සම්බන්ධතා ඇති කිරීමටත්. දැනට පවත්නා සම්බන්ධතා ශක්තිමත් කිරීමටත් කටයුතු කරන ලදී. කාර්මික පුහුණුව නව විෂය මාලාවේ කොටසක් බවට පත්ව ඇත. එසේම සහභාගිත්ව සංකල්ප ස්වභාව කොට ගත් හා ගැටළු නිරාකරණය සඳහා යොමුවූ උපාධි පාඨමාලා ඉදිරි අනාගතයේදී ඉදිරි පත් කිරීම සඳහා මූලික

කටයුතු අදාල වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ජාතික සංවර්ධනය හා කාර්මික අභිවර්ධනයට වඩාත් සුදුසු හා යෝග්‍ය වූ පශ්චාත් උපාධි ලාභීන් බිහි කිරීම කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණයි.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් බිහි කරනු ලබන උපාධි ධාරීන්ගේ කාර්යය සාධනය හා බැඳි ආචාර ධර්ම සංවර්ධනය කිරීමත් එමගින් ඔවුන්ගේ ජීවිත හා අඛණ්ඩව බැඳුනු විනය හා ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම මගින් ආයතනික. අධ්‍යයන හා සමස්ථ ප්‍රජාවගේ විනය සහතික කිරීමටත්, එමගින් මනා කැපවීමක් හා කාර්ය ශූර භාවයකින් යුක්ත අධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමත් ඉදිරි අරමුණු වේ.

මහාචාර්ය කොලින් එන්. පීරිස්
අධ්‍යක්ෂ
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

4. සම්පත් හා සිසුන්

ආයතනය	පාඨමාලාව	මුළු සිසුන් සංඛ්‍යාව (2011)	මුළු ආචාර්ය වරුන් සංඛ්‍යාව (2011)	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	ප .උ. ඩිප්ලෝමා	12	ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන්-02. පැවරුම් පදනම මත-01 හා ආගන්තුක කාර්ය මණ්ඩලය 300ක් පමණ වේ	38
	විද්‍යාපති	320		
	ව්‍යාපාර පරිපාලනපති	29		
	දර්ශණපති	24		
	දර්ශණශූරි	15		
	වෙනත්	11		
එකතුව		411		

5. දේශීය සිසුන්

ආයතනය	පාඨමාලාව	මාධ්‍ය	බඳවා ගැනීම 2011	ප්‍රථම වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිව්වන වසර සිසුන්	උපාධි ලැබූ සංඛ්‍යාව
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	ප.උ. ඩිප්ලෝමා	ඉංග්‍රීසි	12					38
	විද්‍යාපති		320					153
	ව්‍යාපාර පරිපාලනපති		29					28
	දර්ශණපති		24					14
	දර්ශණශූරි		13					02
	වෙනත්		11					
එකතුව			409					235

6. විදේශීය සිසුන්

ආයතනය	පාඨමාලාව	මාධ්‍ය	බඳවා ගැනීම 2011	ප්‍රථම වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිව්වන වසර සිසුන්	උපාධි ලැබූ සංඛ්‍යාව
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	ප.උ. ඩිප්ලෝමා	ඉංග්‍රීසි						
	විද්‍යාපති							
	ව්‍යාපාර පරිපාලනපති							
	දර්ශණපති							
	දර්ශණශූරි		02					
එකතුව			02					

7. අධ්‍යයන කාර්ය මණ්ඩලය

ආයතනය	විෂය	මාධ්‍ය	ජ්‍යෙ. මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙ. කථිකා-චාර්ය	කථිකා-චාර්ය	සහාය කථිකා-චාර්ය	උපදේශකයන්
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	අධ්‍යක්ෂ	ඉංග්‍රීසි	01					
	යාධිපති						01	
			01				**01**	

8. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ශාඛාව	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙ. කාර්ය මණ්ඩලය	ආධුනික කාර්ය මණ්ඩලය	සුළු සේවකයන්
පරිපාලන	02	02	04	10
ප්‍රවේශ	01	-	04	01
ගිණුම්	01	01	05	01
සමූප ඒකකය	-	-	01	-
කෘ.වි.ප.උ.ආ.පුස්තකාලය	-	02	02	03
පරිගණක ඒකකය	01	-	01	01
එකතුව	**05** [1]	**05** [2]	**17** [3]	**16** [4]

(1) පරිපාලන හා විධායක මට්ටම

(2) ජ්‍යෙ. කාර්ය මණ්ඩලය

(3) ලිපිකාර හා සම ශ්‍රේණි

(4) ඉහත ශ්‍රේණිවලට පහළ

9. පර්යේෂණ. නිර්මාණ හා ප්‍රකාශණ

විෂය	ප්‍රකාශයට පත්කළ	වාණිජමය	ඉදිරිපත් කළ
අ. පර්යේෂණ සංඛ්‍යාව	16	-	16
ආ. නිර්මාණ සංඛ්‍යාව	-	-	-
ඇ. වාර සඟරා සංඛ්‍යාව	04	04	-
ඇ. පොත් සංඛ්‍යාව	03	03	-
ඇ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඉ. වෙනත්	-	-	-
එකතුව	**23**	**07**	**16**

10. වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු

විෂය	සහභාගි වූ	අවසන් කළ	ඉදිරිපත් කළ
අ. පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව			29
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව			01
ඇ. උපාධි වැඩසටහන් සංඛ්‍යාව			-
ඈ. ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව			-
ඉ. සහතික පත්‍ර වැඩසටහන් සංඛ්‍යාව			-
ඊ. වෙනත් - පර්යේෂණ සම්මන්ත්‍රණ සම්මන්ත්‍රණ වැඩමුළු කෙටි පාඨමාලා			15 01
එකතුව			46

11. ලබාගත් සම්මාන

විෂය	සම්මාන සංඛ්‍යාව	ආචාර්යවරු සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය සම්මාන	01		02
ආ. ජාතික සම්මාන	09		08
ඇ. ජාත්‍යන්තර සම්මාන			
ඈ. වෙනත් සම්මාන			
එකතුව	10		10

12. ආරම්භ කළ නව පාඨමාලා

ආයතනය	පාඨමාලාව	මාධ්‍ය	සහතික පත්‍ර	ඩිප්ලෝමා	ප.උ. ඩිප්ලෝමා	ශාස්ත්‍රපති/ විද්‍යාපති	දර්ශන-පති	දර්ශන-ශූරි
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	--							
එකතුව								

13. පුනරාවර්තන වියදම්

විෂය	2010 (රු.)	2011 (රු.)
අ. පුද්ගල වේතන	32,475,048	32,281,916
ආ. ගමන් ගාස්තු	131,134	86,548
ඇ. සැපයුම්	2,412,585	2,130,967
ඈ. නඩත්තු	703,340	713,751
ඉ. කොන්ත්‍රාත් සේවා	5,001,964	4,840,840
ඊ. වෙනත්	11,309,466	12,240,319
එකතුව	**52,033,537**	**52,294,341**

14. ප්‍රාග්ධන වියදම්

විෂය	2010 (රු.)	2011 (රු.)
අ. කාර්යාල ලී බඩු හා උපකරණ ලබාගැනීම	2,147,057	70,826
ආ. යන්ත්‍ර ලබා ගැනීම		
ඇ. ගොඩනැගිලි හා ව්‍යුහයන් ලබාගැනීම	609,096	-
ඈ. වෙනත්		325,087
එකතුව	**2,756,153**	**395,913**

15. ව්‍යාපෘති (දේශීය /විදේශීය ආධාර ලැබූ)

නම	ණය/ප්‍රදාන	ආධාර කරන ආයතනය	TEC (රු.)	RFA (රු.)	DF (රු.)
CAPNET	ප්‍රදාන	CAPNET දකුණු අප්‍රිකාව	934,700		
Crossing Boundaries Project	ප්‍රදාන	DGIS නෙදර්ලන්තය	75,035,938		
එකතුව	-		**75,970,638**	-	-

16. ව්‍යාපෘති වියදම් (දේශීය /විදේශීය ආධාර ලැබූ)

නම	TEC (රු.)	2010 වියදම (රු.)	2011 වියදම (රු.)	2011-12-31 දිනට ගණනය කළ වියදම (රු.)	භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
CAPNET	934,700	654,306	2,266,312	2,920,618	100%
Crossing Boundaries Project	75,035,938	18,144,865	12,314,322	30,459,187	80%
එකතුව	**75,970,638**	**18,799,171**	**14,580,634**	**33,379,805**	**180%**

17. මූල්‍ය ප්‍රගතිය (වියදම)

විෂය	2011 සැපයීම (රු.)	2011 වියදම (රු.)	ඉතිරි කිරීම්/ අතිරික්ත (රු.)
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	69,358,000	52,294,341	17,063,659
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	2,000,000	395,913	1,604,087
ඇ. ව්‍යාපෘති- දේශීය ආධාර		790,283	(790,283)
ඈ. ව්‍යාපෘති- විදේශීය ආධාර	107,525	14,580,634	(14,473,109)
එකතුව	**71,465,525**	**68,061,171**	**3,404,354**

18. මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කළ ආදායම)

ආදායම් මූලාශ්‍ර	2011 සැපයීම (රු.)	2011 එකතු කිරීම් (රු.)	හිග/අතිරික්ත (රු.)
අ. ප්‍රථම උපාධි අධ්‍යයන			
ආ. පශ්චාත් උපාධි අධ්‍යයන	58,186,000	48,287,970	(9,898,030)
ඇ. උපදේශන			
ඈ. වෙනත්			
එකතුව	**58,186,000**	**48,287,970**	**(9,898,030)**

19. මුදල් කාර්ය සාධන විශ්ලේෂණය – 2011

විෂය	සූත්‍රය	එක් සිසුවෙකු සඳහා වියදම (රු.)
අ. එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම (RE)	පු.වි/ ශිෂ්‍ය සංඛ්‍යාවේ ශක්තිය	147,724
ආ. එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රා.වි. / ශිෂ්‍ය සංඛ්‍යාවේ ශක්තිය	428
එකතුව		**148,152**

20. 2011 වසරේ ලද යටිතල පහසුකම්

යටිතල පහසුකම් විස්තර	වියදම රු.	භෞතික ප්‍රගතිය
කිසිවක් නැත		

21. වෙනත් යම් විස්තර වෙතොත්/මෙම වාර්තාවට අදාල කාර්ය සාධනය

නැත

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } පීවල්/පෙව්/ජේ/පීජීඅයිඒ/2012/28

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 ජනවාරි 21 දින.

අධ්‍යක්ෂ,
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

DR
final pl.
24/1/13

එච්.ඒ.එස්.සමරවීර,
විගණකාධිපති.

පිටපත් :-
1. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 / 034
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } පීජීඒ/හෝඩි/ජේ/ පීජීඅයිඑස්/2012/28

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 ජනවාරි 21 දින.

අධ්‍යක්ෂ,
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය සහ III වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2012 අගෝස්තු 22 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 / 034
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ - மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයාගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.1, 2.2.2 සහ 2.2.3 ඡේද වල ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන.

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2.1, 2.2.2 සහ 2.2.3 ඡේද වල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්.

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 05ට පටහැනිව ගබඩා තොග අයිතමයන් යටතට නොගැනෙන වටිනාකම රු.777,777ක් වූ පොත්පත් හා ග්‍රන්ථ 1,682 ක් අනුචිත ලෙස තොග යටතේ ගිණුම්ගත කර තිබුණු අතර රු.771,683 ක් වටිනා ග්‍රන්ථ 115 ක් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විදේශීය ශිෂ්‍යාවක් වෙනුවෙන් ඇයගේ අධ්‍යයන වියදම් පියවා ගැනීම සඳහා ආයතනය විසින් දරන ලද රු.97,276ක වියදම සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූරණය වී තිබුණු අතර, එම අගය අදාල වියදම් ගිණුම් වලට ගැළපීමෙන් තොරව පොදු සංචිත ගිණුමට ගැළපීම් කොට තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 20 දින තායිලන්තයේ පවත්වන ලද සම්මන්ත්‍රණයකට සහභාගී වීම පිණිස විදේශගත වූ ශිෂ්‍යයින් 05 දෙනෙකු සඳහා වියදම් ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් රු.131,775ක මුදලක් ගෙවා තිබුණු අතර, එම මුදල වර්ෂයේ වියදමක් ලෙස සලකා අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන ගිණුමට අනුචිත ලෙස හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

(ඇ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුයුක්ත විදුලි අධිකාරිවරයෙකු ආයතනයේ සේවය කිරීම වෙනුවෙන් 2010 අප්‍රේල් සිට 2011 ජුනි දක්වා කාලයට අදාලව රු.14,000 ක ගාස්තුවක් පුද්ගලික විශේෂ සේවා ගිණුමට හර කර ගෙවා තිබුණි. ඒ තුළ අඩංගු 2010 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල රු.9,000 ක වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වියදම් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. 2011 අගෝස්තු සිට 2012 ජුලි දක්වා කාලයට අදාල ඡායාස්ථ පිටපත් යන්ත්‍ර වාර්ෂිකව සේවා ගිවිසුම් අලුත් කිරීම සඳහා රු. 31,740 ක් ගෙවා තිබුණු අතර ඒ තුළ අඩංගු ඉදිරි වර්ෂයට අදාල රු. 18,515 ක වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් එම වර්ෂය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ වෙනුවෙන් දරන ලද රු.12,000 ක වියදමක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 පෙබරවාරි 09 දින ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කරන ලද රු.6,000 ක් වටිනා ටෝනර් සඳහා වූ වියදම වර්ෂයේ වියදමක් ලෙස අනුචිත ලෙස රසායනික සැපයුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රු.66,380 ක් වැය කර සිලිං විදුලි පංකා 12ක් මිලදී ගෙන තිබුණු අතර, එම වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමෙන් තොරව වෙනත් සැපයුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) රුහුණු විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට ඉකුත් වර්ෂයන්හි දින 03 ක් තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ සඳහා රු.60,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු අතර, එම මුදල වර්ෂයේ වියදමක් ලෙස සම්මන්ත්‍රණ ගිණුමට හර කර තිබුණි.

(ඌ) 2010 දෙසැම්බර් මාසයට අදාලව මහාචාර්යවරයෙකු වෙත ගෙවන ලද රු.25,452 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වැටුප් වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්වා තිබුණි.

(එ) ඉකුත් වර්ෂය තුළ බාහිර දේශන ගාස්තු සඳහා වෙන් කිරීම රු.1,117,550 ක් වුවද, ඊට අදාලව සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම රු.3,985,475 ක් වූ අතර ශේෂය බාහිර දේශන ගාස්තු ගිණුමට හර කර තිබීම හේතුවෙන් දේශන ගාස්තු වියදම් රු.2,867,925 ක් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඊ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් නඩත්තු කරන ලේඛන පර්දි ආයතනය විසින් භාවිතා කරන ලද ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් රු.442,012ක් වුවද, ඊට අදාළව ගිණුම්ගත කර ඇති වටිනාකම රු.287,128ක් වූයෙන් රු.154,884ක වියදමක් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

ගිණුම් විෂයය	මුදල	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
ස්ථාවර වත්කම්	121,319,780	ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන
පුස්තකාල පොත්	33,387,254	සමීක්ෂණ මණ්ඩල වාර්තා
	154,707,034	

2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(3) වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම්, වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මූලධන වියදම් ඇස්තමේන්තුව, 2011 දෙසැම්බර් 31 දිනට අයවැයගත ශේෂ පත්‍රය, වාර්ෂික අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

i. මු.රෙ. 188	පේරාදෙණිය ලංකා බැංකුවේ ජංගම ගිණුමෙහි 2003 සිට 2010 ජූලි දක්වා කාලයට අදාළ තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවූ රු.10,230ක් වටිනා චෙක්පත් 06ක් හා පේරාදෙණිය මහජන බැංකුවේ ජංගම ගිණුමෙහි 2011 දෙසැම්බර් මස බැංකු සැසඳුමේ සඳහන් තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවූ රු.7,440ක් වටිනා චෙක්පත් 02ක් සහ මුදල් ඇණවුම් 15ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.
ii. මු.රෙ. 371	i. කථිකාචාර්යවරයෙකුට 2011 පෙබරවාරි 28 දින ලබාදුන් රු.10,000ක අත්තිකාරම් මුදලක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මාස 03කට පසු පියවීම් කර තිබුණි.
	ii. තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැක්කේ මාණ්ඩලික ගණයට අයත් නිලධාරීන්ට පමණක් වුවද, සමාලෝචිත වර්ෂයේ රු.13,870ක මුදලක් පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයෙකුට ලබා දී තිබුණි.
iii. මු.රෙ. 371(5)	තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්ය නිම කළ විගස පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දී ලබා දුන් රු.221,092 ක් වූ අත්තිකාරම් 02ක් වර්ෂය අවසානය වන විටත් පියවීම් කර නොතිබුණි.
iv. මු.රෙ. 571	අවුරුදු 2 ට වැඩි තැන්පතු ආදායමට ගැනීමට හෝ නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නිරවුල් කර ගත යුතු වුවද, වටිනාකම රු.118,003ක් වූ කොන්ත්‍රාත් තැන්පතු එපරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

v. මු.රෙ. 880	රජයේ මුදල්, ආදායම්, බඩු බාහිරාදිය භාරව සිටින නිලධාරීන් මෙන්ම වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන අය විසින් ප්‍රමාණවත් පරිදි ඇප තැබිය යුතු වුවද, අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ මූල්‍යාධිකාරී, මුදල් අයකැමි, ගබඩා භාරකරු යන අය විසින් එසේ ඇප තබා නොතිබුණි.
(ඇ) 2002 නොවැම්බර් 28 දින හා අංක අයිඊඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක යන්ත්‍රවලට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.
(ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය IX පරිච්ඡේදයේ 08 ඡේදය	මාසික අතිකාල ප්‍රමාණය මාසික ඒකාබද්ධ වැටුපෙන් 35% ක් නොඉක්මවිය යුතු වුවද, ඊට පටහැනිව එම සීමාව ඉක්මවා සේවකයින් 13 දෙදෙනෙකු වෙත අවස්ථා 49 දී රු.87,397ක් ගෙවා තිබුණි.
(ඉ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛය	
i. 7.4.5 ඡේදය	ස්ථාවර වත්කම් සමීක්ෂණය කර නොතිබුණි.
ii. 8.3.5 ඡේදය	අධ්‍යක්ෂවරයා සඳහා මාසික ඉන්ධන සීමාව පෙට්‍රල් වාහනයක් සඳහා ලීටර් 180ක් වුවද, මාස 03 ක් තුළ එම සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 168ක් ලබාගෙන තිබුණි.
iii. 8.8 ඡේදය	කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන කාර්ය මණ්ඩලය වෙත බලතල බෙදා දිය යුතු වුවද, නිලධාරීන් 47 දෙනෙකු සම්බන්ධයෙන් එසේ බලතල බෙදා දී නොතිබුණි.

(ඊ)	1990 ඔක්තෝබර් 10 දින අංක:41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මාස 06කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද, ආයතනය සතු වාහන 04ක් සම්බන්ධයෙන් එසේ පරීක්ෂණ පවත්වා නොතිබීම නිසා, විවිධ ප්‍රමාණයන් යොදා ඉන්ධන දහනය කර තිබුණි.
(උ)	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 18 ජේදය පරිදි	ආයතනගත නිලධාරීන්ගේ සුභසාධන කටයුතු සඳහා වියදම් දැරීමට අවකාශ සැලසී නොතිබුනද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී රු.34,000 ක මුදලක් එබඳු කටයුතු සඳහා වැය කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ වැඩකටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.5,369,318 ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා වූ රු.22,585,072 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම ඌනතාවය රු.17,215,754 ක අතිරික්තයක් ලෙස වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර වූ ඌනතාවය රු.1,770,860 ක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රු.18,000,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එය රු.19,770,860 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1978 මාර්තු 10 දිනැති අංක පීඊ/1/774/11 (බී) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධානවලට පටහැනිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ උපදෙස් මත දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා ලෙස 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.1,193,432 ක් ගෙවා තිබුණි.

(ආ) 2003 ජූලි 18 දිනැති අංක පීඩී/අයි/එන්එස්/ඩීඑල්/ජේඑස්/ඒ 078 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපිය පරිදි සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් දායක මුදල් ගණනය කිරීමේ දී අධ්‍යයන දීමනා අදාළ කර නොගත යුතු වුවද, එයට පටහැනිව ගණනය කිරීම හේතුවෙන් 2001 සිට 2011 වර්ෂය දක්වා රු.2,724,475ක් වූ අධ්‍යයන දීමනා වෙනුවෙන් රු.490,403ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2003 නොවැම්බර් 29 දිනැති අංක 837 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අභිබවා චලණ් 2004 නොවැම්බර් 24 දිනැති අංක 150.2.1 දරන කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් විසින් ප්‍රතිඵල සකසමින් ලබාදීම වෙනුවෙන් 10% බැගින් රු.156,375 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතුවල නිරත වූ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 1,255 දෙනෙකු වූ අතර, ඒ වෙනුවෙන් දරන ලද වියදමට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය රු.41,669 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එම අගය රු.31,402 ක් වී තිබුණි.

(ආ) පර්යේෂණ කටයුතු සිදු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වී තිබුණද, පසුගිය වර්ෂ 5 ක කාලයක් තුළ අභ්‍යන්තර පර්යේෂණ වෙනුවෙන් කිසිදු වියදමක් දරා නොතිබූ එම පර්යේෂණ 07 සඳහා සහභාගි කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 21කට පමණක් සීමා වී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.15,298,947 ක් වටිනා බාහිර පර්යේෂණ 07ක් සිදු කර තිබුණි. මේ හේතුවෙන් රු.1,780,695 ක් වැය කර සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද වාර්ෂික සමුළුව මගින් එළි දක්වන ලද සියලුම පර්යේෂණ බාහිර පර්යේෂණ ප්‍රතිඵල වලට සීමා වී තිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

පර්යේෂණ කටයුතු සඳහා මුදල් වෙන් කර නොතිබියදීත්, වර්ෂය තුළ බාහිර පර්යේෂණ 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, 2004 සිට 2011 අතර කාල සීමාවකට අයත් රු.1,008,769 ක පර්යේෂණ 07ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.

4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාවිතයට ගත නොහැකි පරිගණක මේස 09ක් සහ පරිගණක උපාංග 28 ක් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 සිට 2008 දක්වා මිලදී ගන්නා ලද ශිෂ්‍ය අත්පොත් වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.123,264 ක් වටිනා පොත් 1,200 ක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඇ) රු.49,000 ක් වැය කර පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණද, 2012 ජුනි මස වන විටත් එම මෘදුකාංගය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 1979 අංක 09 දරන නියමාවලියට අනුව ආයතනය යටතේ කුමන හෝ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඉඩකඩ සැලසී නොතිබියදී, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 02 දෙදෙනෙකු සහ වැඩසටහන් සම්බන්ධීකාරකවරයෙකු බඳවා ගෙන 2008 සිට 2010 වර්ෂය දක්වා ඔවුන් වෙත රු.1,608,000 ක දීමනා ගෙවමින් ව්‍යාපෘති කටයුතු කිරීම උදෙසා ජාතික කාබනික මධ්‍යස්ථානය (NCOA) සහ ශක්තීන් උත්පාදනය කිරීමේ මධ්‍යස්ථානය (CRES) නමින් මධ්‍යස්ථාන 02ක් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මධ්‍යස්ථාන 02 ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. තවද, මෙම මධ්‍යස්ථාන වෙත වර්ෂ 03 කට ප්‍රථම උපදේශන ගාස්තු, සම්පත්දායක දීමනා, වැඩමුළු පැවැත්වීම හා වෙබ් අඩවියක් ඇරඹීම යන කාරණා වෙනුවෙන් ලබා දී තිබුණු රු.2,867,220 ක ප්‍රදානයක් උපයෝගී කර ගෙන අදාල කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ආ) කාබනික ගොවිපල ආකෘතියක් සකස් කිරීම සඳහා රු.1,800,000ක ඇස්තමේන්තුගත අගයක් මත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2009 ඔක්තෝබර් මසවන විට පෞද්ගලික ආයතනයකින් රු.300,000ක මුදලක් ලැබී තිබුණු අතර, එම කාර්යය 2012 ජූනි මස වන විටද ආරම්භ කර හෝ නොතිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2008 සැප්තැම්බර් 27 දින විශ්‍රාමගොස් සිටි පීඨයට අයත් පුස්තකාල සේවකයෙකු වෙත පාරිතෝෂික දීමනා ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.33,635ක අධිභාර මුදලක් 2011 ජූනි 18 දින මුදල් කම්කරු නිර්දේශය මත සහකාර කම්කරු කොමසාරිස් වෙත ගෙවා තිබුණු අතර, මු.රෙ.119 පරිදි එම අධිභාර මුදල වගකිවයුතු නිලධාරියා වෙතින් අයකර ගැනීමට කටයුතු නොකර එම මුදල අපලිත ලෙස විශ්‍රාම පාරිතෝෂික ගිණුමට හර කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ ගිවිසුමේ අංක 7(iii) පරිදි ව්‍යාපෘතියට අදාල පර්යේෂණ කටයුතු අවසන් වූ පසුව එහි ස්ථාවර වත්කම් ආයතනයට පැවරිය යුතු වුවද, පර්යේෂණ කටයුතු නිම කරන ලද ව්‍යාපෘති 04කට අදාල රු.1,415,374ක් වූ ස්ථාවර වත්කම් 2011 දෙසැම්බර් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

[redacted]

4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

ආයතනයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයට ඇතුළුවන සිසුන් හඳුනාගැනීම පිණිස ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස රු.216,092 ක වියදමකින් සංඛ්‍යාත හැඳුනුම්පත් පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, හැඳුනුම්පත් පිළියෙල කිරීමේ ප්‍රමාදය හේතුවෙන් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2012 ජුනි මස වන විටත් එම කාර්යය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 10 ක් වූ අතර, එම තනතුරු පිරවීමට කටයුතු නොකර, ආයතනයේ දේශන සඳහා බාහිර දේශකවරුන් බඳවා ගෙන, බාහිර දේශන ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.7,308,925 ක් ගෙවා තිබුණි.

(ආ) අංක පීඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය පරිදි මාසික සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

4.8 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම

සේවක පාර්තෝෂික ගෙවීම් පිණිස වෙන් කරන ලද රු.8,069,831ක ප්‍රතිපාදන ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු නොකර පැවතුණි.

5. ගිණුම්කරණ කටයුතුභාවය සහ යහපාලනය

5.1 අධ්‍යයන කමිටු

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 14(7) උපඡේදය පරිදි එක් වසරක් සඳහා අඩුම තරමින් රැස්වීම් වාර 06ක් ආයතන මණ්ඩල විසින් පැවැත්විය යුතු වුවද, රැස්වීම් වාර 03-05 අතර ප්‍රමාණයක් ආයතන මණ්ඩල 11 ක් විසින් පවත්වා තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු.736,714ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු වුවද, එසේ පිළියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

5.3 අයවැය පාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් විෂයයන් 08කට අදාළව ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රැස් කර තිබුණු ආදායම රු.10,764,090ක් වූ අතර, එහි ප්‍රතිශතය 0.87% සිට 575% දක්වා පරාසයක පැවතුණි.

(ආ) අය විෂයයන් 10කට අදාළව එකතුව රු.13,798,118 ක් වූ ආදායම් ඇස්තමේන්තුගත ආදායම් කරා ළඟා වී නොතිබුණු අතර, එහි ප්‍රතිශතය 16% සිට 88% දක්වා පරාසයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 50(ii) පරිදි, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිවත්, සම්පූර්ණවත්, පිළියෙල කිරීමට ගණනදීමේ නිලධාරීන් වග බලා ගත යුතු වුවත්, වැය විෂයයන් 30කට අදාළ ඉතිරිය රු.20,083,444 ක් වී තිබූ අතර, එහි ප්‍රතිශතය 9% සිට 98% දක්වා පරාසයක පැවතුණි.

(ඈ) වැය විෂයයන් 17කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා දරන ලද වියදම රු.3,649,839ක් වූ අතර, එහි ප්‍රතිශතය 1% සිට 159% ක් දක්වා වූ පරාසයක පැවතුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 6.3.1 ඡේදය පරිදි ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඇතුළත් කර නොතිබුණු අතර, වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතු ශිෂ්‍ය තොරතුරු අනුව ශිෂ්‍ය සංඛ්‍යාව 3,903 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව අනුව බෝග සමාකරණ නිරූපකරණය පිළිබඳ පාඨමාලාව සහ පාරභෝගික අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ආහාර නිෂ්පාදන යන පාඨමාලා ආරම්භ කර ඇති බව දක්වා තිබුණද, 2012 වර්ෂය වන විටත් එම පාඨමාලා ආරම්භ කර හෝ නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂවරයා වෙත විටින් විට මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) අත්තිකාරම්
(ඈ) මිලදී ගැනීම්
(ඉ) පර්යේෂණ හා ප්‍රදානයන් සම්බන්ධ කටයුතු
(ඊ) පුස්තකාල පොත් පරිහරණය
(උ) කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම

එච්.ඒ.එස්. සමරවීර.
විගණකාධිපති.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

විගණන පිළිතුරු වාර්තාව

දිනය: 25.03.2013

විමසීම් අංකය : සීඑල්/කේඩී/ජේ/04/පීජීඅයිඒ/2012/28
ලිපි යොමුව : සහකාර විගණකාධිපති, රජයේ විගණන අංශය වෙතටයි
විෂයය : විගණකාධිපති වාර්තාව - 2011

ඔබ විසින් මා වෙත යොමු කරන ලද උක්ත අංක දරන 2013.01.21 දිනැති විගණන විමසුම් වාර්තාවට අදාල හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

2..

2.2.1. විගණන වාර්තාවේ තොග අයිතමයන් යටතට නොගැනෙන රු. 777,777 ක මුදල රු. 615,877.00 ක් ලෙස නිවැරදි විය යුතුය. මෙම පොත්පත් හා ග්‍රන්ථ වල වටිනාකම 2012 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී වාර්ෂික තොග වටිනාකමින් ඉවත් කර ජංගම වත්කම් වල වෙනම ශීර්ෂයක් යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත.

විගණන වාර්තාවේ දක්වා ඇති රු. 777,683 ක් වටිනා ග්‍රන්ථ ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව හදාරන සිසුන් සඳහා මිලදී ගත් ග්‍රන්ථ වන අතර ශිෂ්‍යයින් විසින් ලබා නොගත් ග්‍රන්ථ වල වටිනාකම 2012 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.

2.2.2.

(අ.) පිළිනොගනිමු. ජර්නල් අංක 114 ට අදාල සංලක්ෂය මගින් දක්වා ඇති පරිදි 2010 වර්ෂයේ තැන්පතු ලෙස තිබිය යුතු මුදලක් වැරදීමකින් ලාභයට ගැලපී තිබූ බැවින් එය පොදු සංචිත ගිණුමට ගැලපීම තුලින් ටී.අහමඩ් ශිෂ්‍යාගේ තැන්පතු අරමුදලේ ශේෂය නිවැරදි කරන ලදි.

(ආ) පෙර වර්ෂයට අදාල රු. 131,775 ක වියදම් ප්‍රතිපූරණය කිරීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගත කිරීම, ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඇ). විදුලි අධිකාරිවරයාට ගෙවන ලද මුදලින් රු. 9,000.00 ක වියදම හා ජායා පිටපත් යන්ත්‍ර සේවා ගිවිසුම අලුත් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු. 31,740.00 ක මුදල එම වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීම අදාල වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඈ). 2010 වර්ෂයේ ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් දරන ලද රු 12,000 ක මුදල වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීම අදාල වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඉ) 2012 වර්ෂයේ ප්‍රධාන ගබඩාවෙන් ලබා ගන්නා ලද ටෝනර් සඳහා වූ රු.6,000.00 ක වියදම වර්ෂයේ වියදමක් වශයෙන් රසායනික සැපයුම් යටතේ අනුචිත ලෙස සටහන් කිරීම එම වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. නිමු. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඊ) රු. 66,380 ක් වූ සිලිං විදුලි පංකා මිලදී ගැනීම සඳහා වූ වියදම 2012 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර ඒ අනුව මිලදී ගත් දිනයේ සිට ක්ෂය ප්‍රතිපාදනයන් ගැලපීමට කටයුතු කර ඇත. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(උ). රුහුණු විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට ඉකුත් වර්ෂයේ පවත්වන ලද සම්මන්ත්‍රණයක් සඳහා ගෙවූ රු. 60,000 ක මුදල වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම් ගත කිරීම අදාල වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. මෙම ගිණුම්කරණ දෝෂ මග හැර 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඌ). 2010 දෙසැම්බර් 15 සිට 31 දක්වා අදාල වූ කාලයට අදාලව මහාචාර්යවරයෙකුට ගෙවන ලද රු. 25,452.00 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම අදාල වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. මෙම දෝෂ මග හැර ඉදිරි මුදල් වර්ෂවල ගිණුම් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි.

(එ). 2010 වර්ෂය සඳහා බාහිර දේශන ගාස්තු වෙනුවෙන් වෙන් කරන ලද රු. 1,117.550 ක මුදල ඉක්මවා පෙර වර්ෂවලට අදාලව සිදු කරන ලද බාහිර දේශන ගාස්තු වියදම වූ රු. 2,867,925 ක මුදල පොදු සංචිත ගිණුමට ගැලපීමෙන් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම අදාල වර්ෂයේ ගිණුම්කරණ දෝෂයක් බව පිළිගනිමු. 2012 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ගෙවිය යුතු බාහිර දේශන ගාස්තු වෙනුවෙන් නිවැරදි ප්‍රමාණයන් වෙන් කිරීමට කටයුතු කර ඇත.

(ඒ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගෙවීම් වාර්තාවලට අනුව ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු වටිනාකම රු. 287,128.00 ක් වූ බැවින් ඒ සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කර තිබුණි. එහෙත් විශ්වවිද්‍යාලය මගින් වර්ෂය අවසානයට ගෙවිය යුතු වටිනාකම රු. 442,012.00 ක් ලෙස දක්වා තිබූ බැවින් පසු ගිය වර්ෂ සඳහා සියලුම ගෙවීම් විස්තර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත යොමු කොට ගෙවිය යුතු නිවැරදි මුදල ගෙවා නිරවුල් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

2.2.3 <u>ස්ථාවර වත්කම් ලේඛණය හා උපලේඛන</u>

මිලදී ගත් පරිඝණක මෘදුකාංගයක ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. එසේම ආයතනයට

මිලදී ගනු ලබන සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ ඉන්වෙන්ට්‍රි ලේඛන පාලන අංශයේ හා අදාල අංශ වල නඩත්තු කරනු ලබන අතර ඒවා යාවත්කාලීන කර ඇත.

<u>සමීක්ෂණ මණ්ඩල වාර්තා</u>

මේ වන විට පුස්තකාලයේ පවතින සියළුම පොත්පත් පිළිබඳව සියලු විස්තර Access Register හා පරිඝණක මෘදුකාංගයක ඇතුලත් කර ඇති අතර පුස්තකාල පොත් සමීක්ෂණ කටයුතු මේ වන විටත් ආරම්භ කොට අවසන් මට්ටමේ පවති.

2.2.4

(අ) වාර්ෂික අයවැය ලේඛණය පිළියෙල කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ අංකප 09/2010 ප්‍රකාරව ඉල්ලා ඇති ආකෘතිපත්‍ර වල, විගණන වාර්තාවේ දක්වා ඇති ප්‍රකාශන ඇතුලත් නොවන බව දන්වා සිටිමි එහෙත් විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි 2013 වර්ෂයේ සිට අයවැය ගත මුදල් ප්‍රකාශ හා ශේෂ පත්‍රය වාර්ෂික අයවැය ලේඛණය සමග ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ආ)

i නිශ්කාෂණය නොවූ තැන්පතු සම්බන්ධයෙන් අදාල බැංකු වෙත දැනුම් දීමක් කොට පැහැදිලි කිරීම් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ආයතනයේ මූල්‍ය කමිටුවේ නිර්දේශය හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මුදල් රෙගුලාසි 188 ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.

ii.

i මෙම ආයතනයේ දර්ශනපති උපාධියක් හදාරන සිසුවියකගේ පර්යේෂණ කටයුතු සඳහා ඇයගේ පර්යේෂණ පරීක්ෂකවරිය වෙත කුණු කසල බැහැර කිරීමේ ස්ථානයක් සෑදීම සඳහා වූ ව්‍යාපෘතියක අතිරේක වැඩ වෙනුවෙන් මෙම අත්තිකාරම් මුදල ලබා දී තිබුණි. එහෙත් ඒ වන විට පැවති අයහපත් කාලගුණය හේතුවෙන් එම කාර්යය ආරම්භ කිරීමට නොහැකි වූ බැවින් එම අත්තිකාරම් මුදල ආපසු සම්පූර්ණයෙන්ම පියවා ඇත.

ii මෙම ආයතනයේ ආචාර්ය උපාධියක් හදාරන සිසුවියකගේ පර්යේෂණ කටයුතු සඳහා මෙම අත්තිකාරම් මුදල ලබා දී ඇති බව පිළිගනිමු මින් ඉදිරියට මාණ්ඩලික නිලධාරින්ට හැර බාහිර පාර්ශව වෙත අත්තිකාරම් ලබා නොදීමට සටහන් කර ගන්නා ලදි.

iii **<u>ඩී.එන්.ජයසිංහ මයා රු.5,000.00</u>**

මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආයතන අංශය හා මූල්‍යාධිකාරි දැනුවත් කර තිබුණද මෙතෙක් එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බැවින් ඉදිරියේදී පැවැත්වෙන මූල්‍ය කමිටු හා කළමනාකරණ මණ්ඩලයට යොමු කර එහි තිරණය අනුව කටයුතු කරන බව දන්වා සිටිමි.

ඊ. ඩබ්ලිව් ඉන්ෆොමේෂන් සිස්ටම් ආයතනය

විගණන වාර්තාවේ දක්වා ඇති රු.216,092 ක අත්තිකාරම් මුදල පියවීමට මේ වන විටත් කටයුතු කර ඇත.

iv. අදාල තැන්පතු හිමියන්ගෙන් විමසීමෙන් අනතුරුව විගණන වාර්තාවේ දක්වා ඇති රු. 118,003 ක මුදලින් තහවුරු කිරීම් ලබා ගත් රු. 10,000 ක් තැන්පතු හිමියෙකුට 2012 වර්ෂයේදී ආපසු ගෙවා ඇති අතර ඉතිරි රු 108,003 ක මුදල මූල්‍ය කමිටුවේ නිර්දේශය මත හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත 2012 වර්ෂයේදී අදායමට ගෙන ඇත.

v. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති චක්‍රලේඛ අංක 752 අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිට හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියාට අදාල නිලධාරින් ඇප තැන්පතු වලින් නිදහස් කල හැක (ඇමුණුම 1)

අදාල මාණ්ඩලික නිලධාරින්ගේ පත් වීම් ලිපි වල ඇප තැන්පතු සම්බන්ධයෙන් එවැනි කොන්දේසියක් ඇතුලත් වී නොමැති බව දන්වා සිටිමි. එසේම ගබඩා භාරකරු සඳහා නියම කර ඇති ඇප තැන්පතු මුදල තැන්පත් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

(ඇ) මිලදී ගත් පරිඝණක මෘදුකාංගයක පරිඝණක යන්ත්‍ර පිලිබඳ විස්තර ඇතුලත් කර යාවත්කාලීන කරමින් පවති. එසේම ආයතනයට මිලදී ගනු ලබන සියලුම ස්ථාවර වත්කම් පිලිබඳ ඉන්වෙන්ට්‍රි ලේඛන පාලන අංශයේ හා අදාල අංශ වල පවත්වාගෙන යන බව දන්වා සිටිමු.

(ඈ) ආයතනයේ බොහොමයක් දේශන සති අන්ත දිනවල හා නිවාඩු දින වල රාත්‍රි 9 වනතුරු පැවැත්වෙන බැවින් පරිඝණක අංශය, ශිෂ්‍ය සේවා අංශය හා පුස්තකාලය සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තැබීම අනිවාර්ය වේ. . එමෙන්ම මෙම අංශ වල සේවා සැපයීම වෙනුවෙන් විශේෂ අය කිරීම් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුල එසේ උපයන ලද ආදායම පහත දැක්වේ.

තොරතුරු තාක්ෂණ සේවා ගාස්තු	රු. 2,078,051.00
දේපල මත අය කිරීම්	රු. 452,250.00
පුස්තකාල ගාස්තු	රු. 300,540.00

කෙසේ වෙතත් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි හැකිතාක් දුරට අතිකාල ගෙවීම අඩු කිරීමටත් අතිකාල සීමාව ඉක්මවා සේවය කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ IX පරිච්ජේදයේ 08 ජේදය ප්‍රකාරව කටයුතු කිරීමටත් සටහන් කර ගන්නා ලදි.

(ඉ)

i ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කර 2012 .09.17 දින අදාල ආයතන වලට පිටපත් යොමු කිරීමට කටයුතු කර ඇත.

ii මෙම වාහනය අධ්‍යක්ෂවරයාගේ නිල වාහනය ලෙස සමාලෝචිත වර්ෂය තුල භාවිතයට ගැනීමක් සිදු කර නොමැති අතර සිසුන්ගේ හා ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහාද යොදා ගැනීම සිදු කර ඇත. කෙසේ වෙතත් විගණන වාර්තාවේ සඳහන් පරිදි 2011 ජනවාරි මාසයේ ලබා ගත් ඉන්ධන ප්‍රමාණය ලෙස දක්වා ඇති ලීටර් 245 ක ප්‍රමාණය ලීටර් 75 ක් ලෙස නිවැරදි විය යුතුය.

කෙසේ වෙතත් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි 2012 ඔක්තෝබර් මස සිට මෙම වාහනය අධ්‍යක්ෂතුමාගේ නිල රථය ලෙස භාවිතයට ගැනීමට කටයුතු කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛ අංක 2/2011 පරිදි ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

iii 2013 වර්ෂයේ ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා බලතල හා රාජකාරි බෙදා දීමට කටයුතු කර ඇත.

(ඊ) 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම අගයන් අනුව ඉන්ධන තුලනයන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(උ). කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවකයින්ගේ සේවක සුභ සාධනය සහ සහජීවනය වර්ධනය කිරීම සඳහා සංවිධානය කරනු ලැබූ වාර්ෂික චාරිකාවට සේවකයින් විසින් එම වර්ෂයේ හිමිකම් නොපෑ දුම්රිය බලපත්‍ර වල වටිනාකම එම චාරිකාවේ ප්‍රවාහන වියදම් දැරීම වෙනුවෙන් ලබා දීමට කටයුතු කර ඇත.

3

3.1 සටහන් කරගතිමි. සපයා ඇති තොරතුරු නිවැරදිය.

3.2

(අ) විශ්වවිද්‍යාල සේවකයින් හට භාෂා ප්‍රවීණතා දීමනාව ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛ අංක අනුව හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආයතන අංශය මගින් ඒ සඳහා නිකුත් කර ඇති ලිපිවලට අනුව කර ඇති බව දන්වා සිටිමුග එසේම චක්‍රලේඛ අංක යූජීසී/එෆ් ආර්/6/3/4/(ස) අනුව 2003.01.01 දිනෙන් පසුව බඳවා ගත් සේවකයින් හට මෙම දීමනාව ලබා දී නොමැති බවද දන්වා සිටිමු. මේ සම්බන්ධයෙන් තව දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව වෙත යොමු කල අතර ඒ සඳහා අප වෙත එවූ පිළිතුරු ලිපියේ ඡායා පිටපතක් මේ සමග ඉදිරිපත් කර ඇත. (ඇමුණුම - 2)

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන දීමනාව ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 08/1997,

8/1998 හා යූජීසී/එච් ආර්/3/9/48 අනුව ගෙවා ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2011.04.28 දිනැති අංක 955 දරන චක්‍රලේඛය අනුව 2011 මැයි 01 දින සිට මෙම ගෙවීම නවතා දමා ඇත. (ඇමුණුම 3)

ඇ. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්ගේ ප්‍රතිඵල ලබා දීම කඩිනම් කිරීම සඳහා 178.2.6 දරන කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත අදාල ගෙවීම සිදුකරන ලද අතර මීට පෙර විගණන වාර්තාවලින් ලබා දී ඇති උපදෙස් පරිදි 188.6.3.1 දරන කළමනාකරණ මණ්ඩල තීරණයට අනුව 2011 ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ගෙවීම සම්පූර්ණයෙන් නතර කිරීමට කටයුතු කර ඇත.

4.1.

(අ) ශිෂ්‍ය ප්‍රවේශ අංශයේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරිගණක මෘදුකාංගයකට ඇතුලත් කරමින් පවතින අතර ඒ අනුව නිවැරදි ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන අදාල ඒක ශිෂ්‍ය පිරිවැය ගණනය කොට හැකි ඉක්මනින් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ආ) ආයතනයේ අභ්‍යන්තර පර්යේෂණ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදි සුදුසු අනුමත ක්‍රමවේදයක් නොමැතිවීම නිසා ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු නොකල අතර අංක 178.3.2 දරන කළමණාකරණ මණ්ඩලයේ තීරණය අනුව මේ වන විට අභ්‍යන්තර පර්යේෂණ සඳහා ගිවිසුමක් සකස් කර ඇති අතර වාර්ෂිකව තෝරා ගනු ලබන දර්ශනපති, දර්ශන වේදී හා දර්ශන ශූරි පර්යේෂණ සඳහා අරමුදල් වෙන් කිරීමට කටයුතු යොදා ඇත.

4.2

(අ) විගණන වාර්තාවේ සඳහන් පර්යේෂණ ගිණුම් වල ශේෂයන් 2012 වර්ෂයේදී මූල්‍ය කමිටුවේ නිර්දේශය හා කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත අභ්‍යන්තර පර්යේෂණ සඳහා පහසුකම් සැලසීමේ අරමුදලට(Research Facilitation Fund) ගැනීමට කටයුතු කර ඇත.

4.3.

(අ) විගණන වාර්තාවේ සඳහන් පරිගණක මේස 09 හා පරිගණක උපාංග 28 සම්බන්ධයෙන් සමීක්ෂණ කමිටුවක් පත් කර එහි නිර්දේශයන් අනුව ඉතා ඉක්මනින් එම භාණ්ඩ අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ආ) වර්ෂ ගණනාවකට පෙර මුද්‍රණය කල මෙම ශිෂ්‍ය අත්පොත් මේ කාල පරිච්ඡේදයතුල පරිහරණය කල නොහැකි නිසා මූල්‍ය කමිටුවේ නිර්දේශය හා කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත බැහැර කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

(ඇ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත මේ වන විටත් පරිගණක මෘදුකාංගයකට ඇතුලත් කිරීමට කටයුතු කර ඇති අතර එය යාවත් කාලීන කිරීමේ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී..

4.4

(අ) මීට පෙර විගණන වාර්තා මගින් පෙන්වා දුන් පරිදි මෙම මධ්‍යස්ථාන දෙක විධිමත් ලෙස අනුමැතියක් මත ස්ථාපිත කොට නොතිබූ බැවින් ඒවා වසා දැමීමට කටයුතු කර ඇත. එහි අවසන් ප්‍රගතිය පිළිබඳ වාර්තා අදාල ආයතන වෙත යවා ඇති අතර අවශ්‍ය විටක විගණනය සඳහා ඉදිරිපත් කල හැක.

(ආ) කඩුවෙල ව්‍යාපෘතියේ කාබනික ගොවිපල ආකෘතියක් නිර්මාණය කිරීමේ මූලික වියදම් වෙනුවෙන් මෙන්ඩිස් සමාගම විසින් ලබා දුන් රු.300,000.00 ක මුදල් ප්‍රතිපාදන අදාල කාර්යය වෙනුවෙන් නිදහස් කිරීමට කටයුතු කල අතර ජාතික කාබනික මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මෙම ව්‍යාපෘතිය අදාල මධ්‍යස්ථානය වසා දැමීම නිසා අතර මග නතර කර දැමීමට සිදු විය.

4.5

(අ). පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් පත් කරන ලද විමර්ශන කමිටු නිර්දේශය පරිදි අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් මෙම අධිභාරය අය කර ගැනීමට කටයුතු කරමි.

(ආ) කෘෂිකාර්මික ප්‍රතිපත්ති පර්යේෂණ සභාවේ පර්යේෂණ ව්‍යාපෘති යටතේ මිලදී ගත් බොහොමයක් ස්ථාවර වත්කම් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සාමාන්‍ය කටයුතු සඳහා භාවිතා කල නොහැකි රසායනාගාර උපකරණ වැනි උපකරණ බැවින් එසේ භාවිතා කල නොහැකි උපකරණ තිසි අනුමැතිය යටතේ එම අංශ වලට ලබා දීමටත් අනෙකුත් උපකරණ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පවරා ගැනීමටත් කටයුතු යොදා ඇත.

4.6 අදාල සංඛ්‍යාන හැඳුනුම්පත් පද්ධතිය වෙනුවෙන් රු. 216,092.00 ක අත්තිකාරම් මුදලක් බැඳුම්කරයක් මත ලබාදුන් අතර පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. එහෙත් තාක්ෂණ කමිටුවේ නිර්දේශ ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මුදල් ගෙවීම ප්‍රමාද විය. එහෙයින් එම සමාගම මෙම පද්ධතිය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලදි. එහෙත් මේ වන විට තාක්ෂණ කමිටුවේ නිර්දේශ මත ගිවිසුම් ප්‍රකාරව 5% ක උපරිම ප්‍රමාද ගාස්තු හා සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා ගෙවිය යුතු මුදල ගෙවීමෙන් පසු නැවත එම පද්ධතිය සක්‍රිය කිරීමට කටයුතු කර ඇති අතර අනෙකුත් කාර්යයන් ඉටු කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

4.7

(අ) විගණන වාර්තාවේ සඳහන් අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති අංක යූජීසී/එච්ආර්/09/01/59 හා 19/03/2008 දිනැති ලිපිය අනුව ආයතනයේ අවශ්‍යතාවය මත උපයන ආදායමින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම 4).

අනුමත සේවක සංඛ්‍යාව(Cadre) අනුව සංසන්දනය කිරීමේදී මෙම පුරප්පාඩු වී පවතින තනතුරු 8 පිරවීමේදී සියලු දීමනා ඇතුලත්ව වසරකට දළ වශයෙන් රු. 6,974,168 ක ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවේ. නමුත් බාහිර කථිකාචාර්යවරයෙකු

බැඳවා ගෙන දේශන පැවැත්වීමේදී එක් කථිකාචාර්යවරයෙක් වසරක කාලසීමාවකදී ඉගැන්වීම් කරන විෂයයන් ගනන 2 ක් පමණක් වන අතර එක් පාඨමාලාවක් සඳහා අනුමත අවම ගාස්තුව අනුව ගෙවිය යුතු මුදල රු. 30,000.00 ක් (පැය 30x 1,000.00) පමණ වේ. ඒ අනුව වසරකට ඉගැන්වෙන විෂයයන් වෙනුවෙන් ගෙවන දේශන ගාස්තු ප්‍රමාණය දළ වශයෙන් රු. 960,000.00 (30,000.00x2x2x8) ක් වේ. එම හේතුව නිසා මෙම පුරප්පාඩු සියල්ල පිරවීමට කටයුතු නොකර අවශ්‍යතාවය අනුව බාහිර කතිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගෙන ඇති බව දන්වා සිටිමි.

එසේම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 2 ක් අධ්‍යයන සහායක (Teaching Assistants) ලෙස පරිවර්තනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 5)

(ආ). සටහන් කර ගනිමි. ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට වගබලා ගනිමු.

4.8 පිළිනොගනිමු. සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීම්ද ඇතුළත්ව ආයතනයේ සියළු අතිරික්ත අරමුදල් නිසි සැළැස්මක් යටතේ ආයෝජනය කිරීමට කටයුතු කර ඇත.

5.

5.1 2011 වසරේ විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය මාස තුනහමාරක පමණ කාලයක් පවත්වාගෙන ගිය වෘත්තිය සමිති ක්‍රියාදාමය හේතුකොටගෙන හා තමන්ගේ තනතුරු වලින් ඉවත්වීම හේතුවෙන් අධ්‍යයන මණ්ඩල රුස්වීම් පැවැත්විය යුතු අවම වාර ගණන පැවැත්වීමට නොහැකි විය. එහෙත් ඉදිරියේදී අධ්‍යයන මණ්ඩල රුස්වීම් නියමිත පරිදි පැවැත්වීම සඳහා කාල සටහන් මේ වන විටත් සකස් කර ඇත.

5.2

(අ) විගණන වාර්තාවේ සඳහන් පරිදි 2013 වර්ෂය සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සැලසුම් කර ඇති සියලුම භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම, සේවා සපයා ගැනීම්, ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු සඳහා වන ප්‍රසම්පාදන සැළැස්ම සකස් කොට එහි පිටපත් අදාල ආයතන වෙත යොමු කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

(ආ) පිළිගනිමු. 2013 වර්ෂය සඳහා සකස් කල ප්‍රසම්පාදන සැළැස්මට අදාල කාල සටහන් සකස් කොට අදාල ආයතන වෙත යොමු කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

5.3

(අ) ආදායම් විෂයයන් 08 කට අදාලව ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් රැස් කිරීමට හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

විෂයය	අයවැය ගත වෙන් කිරීම්	සත්‍ය ආදායම	වෙනස	ප්‍රතිශතය %	හේතු පැහැදිලි කිරීම
ණය පොලී	200,000	209,008	(9,008)	4.50	මෙම වසරේ සේවක ණය අපේක්ෂිත ප්‍රමාණයට වැඩියෙන් ගෙවීම හේතුවෙන් වැඩි පොලී ප්‍රමාණයක් එකතු වීම
ආයෝජන පොලී	6,000,000	9,665,419	(3,665,419)	61.09	ස්ථාවර තැන්පතු සඳහා වර්ෂය මැද බැංකු පොලී අනුපාතය ඉහළ යෑම හේතුවෙන්
දේපල කුලී	330,000	452,250	(122,250)	37.04	වර්ෂය තුලදී සංචාරක නිවාස කුලී ගාස්තු හා ශ්‍රවණාගාර ගාස්තු ඉහළ දැමීම
විවිධ ලැබීම්	400,000	1964,713	(1,564,713)	391.17	පසුගිය විගණන වාර්තාවට අනුව ශිෂ්‍යත්ව අරමුදල හා ක්‍රියාත්මක නොවන පර්යේෂණ ආධාර මුදල් අහෝසි කර ආයතනයේ ආදායමට ගැනීම හේතුවෙන්
ශිෂ්‍ය සුභ සාධක ගාස්තු	250,000	286,755	(36,755)	14.70	හිඟ මුදල් ගෙවීම හේතුවෙන්
අධීක්ෂණ ගාස්තු	1,100,000	1,109,657	(9,657)	0.87	වැඩිවීම 0.9% කි.
වාර්ෂික සමුළු ගාස්තු	800,000	5,407,795	(4,607,795)	575.97	මීට පෙර විගණන වාර්තා මගින් පෙන්වා දුන් පරිදිපරිදි වාර්ෂික සමුළු අරමුදල අහෝසි කර ආයතනයේ ආදායමට ගැනීම හේතුවෙන්
පොදු කාර්ය ගාස්තු	600,000	1,348,493	(748,493)	124.74	Crossing Boundaries, CAPNET යන පර්යේෂණ ව්‍යාපෘති මගින් වසර මැද සැලසුම් කරන ලද වැඩමුළු වෙනුවෙන් ලද පොදු කාර්ය ගාස්තු ලැබීම

(ආ) අය විෂයයන් 10 කට අදාළව එකතුව රු.13,798,118 ක් වූ ආදායම් ඇස්තමේන්තුගත ආදායමට ළඟා වී නොතිබීමට හේතු පැහැදිලි කිරීම පහත දැක්වේ.

විෂයය	අයවැය ගත වෙන් කිරීම්	සත්‍ය ආදායම	වෙනස	ප්‍රතිශතය %	හේතු පැහැදිලි කිරීම
පුස්තකාල ගාස්තු	950,000	300,540	649,460	68.36	විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය නිසා සිසුන් බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද විය. එම හේතුවෙන් අපේක්ෂිත ආදායම් නොලැබුණි
ලියාපදිංචි ගාස්තු	6,000,000	4,966,910	1,033,090	17.21	- එම -
දේශන ගාස්තු	30,000,000	19,077,414	10,922,586	36.40	එම -
විභාග ගාස්තු	500,000	409,800	90,200	18.04	-එම -
වෛද්‍ය ගාස්තු	250,000	191,605	58,395	23.35	- එම -
අන්තර් ජාල ගාස්තු	2,500,000	2,078,051	421,949	16.87	- එම -
ප්‍රකාශන අලෙවිය	1,100,000	655,707	444,293	40.39	- එම -
පැරණි භාණ්ඩ විකුණුම්	20,000	2,322	17,678	88.39	වර්ෂය තුල අපේක්ෂා කල පරිදි පැරණි භාණ්ඩ විකිණීමට නොහැකි වීම
බාහිර සේවා	200,000	55,000	145,000	72.50	අපේක්ෂිත ආදායම නොලැබීම
පුස්තකාල දඩ	32,000	16,533	15,467	48.33	පුස්තකාලයේ මනා කළමනාකරණය නිසා ශිෂ්‍යයින් නියමිත කාලයට පොත් ලබා දීම නිසා දඩ අයකර ගැනීම අවම විය.

(ඇ) විගණන විමසුමේ සඳහන් වියදම් ඇස්තමේන්තු වටිනාකම 19,383,743 ක් ලෙස වෙනස් විය යුතු අතර වියදම් විෂයයන් වල අඩි වෙන් කිරීම් සඳහා හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

විෂයය	අයවැය ගත වියදම	තත්‍ය වියදම	ඉතිරිය	ප්‍රතිශතය %	හේතු පැහැදිලි කිරීම
රසායන ද්‍රව්‍ය	700,000	11,350	688,650	98.37	තත්‍ය වියදම රු.654,923.00 ක් ලෙස වෙනස් විය යුතුය. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 1.6% ක අඩි වෙන් කිරීමකි
ප්‍රවාහන	475,000	161,455	313,545	66	අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් සිදු නොවීම
වැටුප් හා වේතන	16,481,000	12,745,477	3,735,523	22.66	අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු කිහිපයක් වර්ෂය තුල පිරවීමට සැලසුම් කර තිබුනද එම කාර්යය වර්ෂය තුල කර ගැනීමට නොහැකි වීම
සේවක අර්ථ සාධක අරමුදල	2,103,000	1,751,858	351,142	16.69	-එම-
සේවා නියුක්ති	507,000	454,107	454,107	10.43	-එම-
ජීවනවියදම් දීමනාව	3,402,000	3,074,205	327,795	9.63	-එම-
වෙනත් දීමනා	83,000	21,637	61,363	73.93	-එම-
බාහිර දේශන ගාස්තු	14,000,000	7,926,163	6,073,837	43.38	විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් සැලසුම් කල පරිදි දේශන පැවැත්වීමට නොහැකි වීම
කථිකාචාර්ය ගමන් වියදම්	1,500,000	408637	1,091,363	72.75	-එම-
විභාග ගාස්තු	2,100,000	1,178,716	921,284	43.87	-එම-
අතිකාල	2,300,000	1,938,769	361,231	15.70	විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය නිසා අනෙකුත් සේවා සැපයීම සීමා කිරීම
නිවාඩු දින වැටුප්	171,000	24,417	146,583	85.72	-එම-
තැපැල් ගාස්තු	300,000	203,836	96,164	32.05	-එම-
ගමන් වියදම්(දේශීය)	300,000	86,548	213,452	71.15	අපේක්ෂිත පරිදි සැලසුම් කල ක්‍රියාකාරකම් සිදු නොවීම නිසා මෙම වියදම් ශීර්ෂ වල අඩි වෙන් කිරීමක් සිදු වී ඇත.
විදුලිය	1,300,000	935,252	364,748	28.05	-එම-
ලිපි ද්‍රව්‍ය	1,250,000	697,070	552,930	44.23	-එම-
ඉන්ධන	700,000	600,189	99,811	14.25	-එම-

යාන්ත්‍රික හා විදුලි	75,000	24,999	50,001	66.66	- එම -
වැඩමුළු	2,000,000	321,500	1,678,500	83.92	- එම -
අධ්‍යයන පර්යේෂණ	300,000	131,775	168,225	56.07	- එම -
උත්සව වියදම්	300,000	216,106	83,894	71.91	- එම -
වෛද්‍ය සැපයුම්	75,000	9,408	65,592	87.45	පිළිනොගතිමු තත්‍ය වියදම රු.65536.00
වාහන	200,000	177,773	22,227	11.11	අලුත්වැඩියා කටයුතු අවම වීම
ජල ගාස්තු	200,000	143,422	56,578	28.28	පිළිගතිමු
නිලධාරි සංවර්ධනය	200,000	41,784	158,216	79.10	අපේක්ෂිත පරිදි සේවකයින් සඳහා පුහුණු වැඩමුළු නොපැවැත්වීම
පර්යේෂණ හා ශිෂ්‍යත්ව	2,400,000	883,293	1,516,707	63.19	විදේශීය සිසුන්ගේ ශිෂ්‍යත්ව දීමනා සඳහා ඇස්තමේන්තු ගත කලත් එම වැය මුදල් වෙනම ගිණුමක් යටතේ ගිණුම් ගත කිරීම
නිවාඩු බලපත්‍ර	30,000	12,680	17,320	57.73	ඇස්තමේන්තු ගත කලද අපේක්ෂිත පරිදි බලපත්‍ර අයදුම් නොකිරීම
ත්‍යාග	25,000	7,500	17,500	70	එම වසරට අදාල සේවකයින් හට ගෙවිය යුතු දීර්ඝ කාලීන සේවා දීමනාව සඳහා ඇස්තමේන්තු ගත කලත් ඒ සඳහා එම වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් නිර්දේශයන් ලැබීම ප්‍රමාද වීම
බැංකු ගාස්තු	100,000	28,082	71,918	71.91	බැංකු විසින් 2011 අප්‍රේල් සිට හර බඳු අය කිරීම අහෝසි කිරීම
වෙනත්	800,000	75,548	724,452	90.55	අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් සිදුනොවීම

(ඈ) වැය විෂයයන් 17 කට අදාලව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා දරන ලද වියදම් සඳහා හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

විෂයය	අයවැය ගත වියදම් ඇස්තමේන්තුව	තත්‍ය වියදම	ඉක්මවීම	ප්‍රතිශතය %	හේතු පැහැදිලි කිරීම
විශ්‍රාම වැටුප්	371,000	428,431	(57,431)	15.48	2011.07.19 දිනැති 14/2011 චක්‍රලේඛය අනුව ජීවන වියදම් දීමනාව සඳහා 2006 සිට විශ්‍රාම වැටුප් ගෙවීම.
අධ්‍යයන දීමනාව	329,000	611,967	(282,967)	86	2011.08.05 දිනැති අංක 961 චක්‍රලේඛය අනුව 2011.ජූලි මස සිට මෙම දීමනාව වැඩි කිරීම.
භාෂා දීමනාව	71,000	74,960	(8,960)	5.57	හිඟ මුදල් ගෙවීම.
විශ්‍රාම පාරිතෝෂික	900,000	2,337,940	(1,437,940)	159.77	2011.07.19 දිනැති හා අංක 14/2011 දරන චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවීම සඳහා ජීවන වියදම් දීමනාව එකතු කිරීම හේතුවෙන්
නිල ඇඳුම්	40,000	81,310	(41,310)	103.27	පසුගිය වසරේ හිඟ මුදල් ගෙවීම.
වෙනත්	525,000	706,641	(181,641)	34.59	නව අධ්‍යක්ෂතුමා හට සංග්‍රහ දීමනාව ගෙවීම.
දේපල උපකරණ	475,000	533,290	(58,290)	12.27	ඇස්තමේන්තු ගත නොකල වියදම් ඇති වීම.
පන්තිවේදන	1,100,000	1,116,474	(16,474)	1.49	ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 1.5% ක ඌන වෙන් කිරීමකි.
ආරක්ෂක සේවා	175,000	272,625	(97,625)	55.78	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2011.08.29 දිනැති චක්‍රලේඛය අනුව 2011 ඔක්තෝබර් මස සිට රක්නා ආරක්ෂක ලංකා ආයතනයට ආරක්ෂක සේවය ලබා දීම අනිවාර්ය කිරීම හා එහි මිල ගනන් වැඩිවීම.
පිරිසිදු කිරීමේ ගාස්තු	700,000	832,703	(132,703)	18.95	වර්ෂය මැද සේවා ගිවිසුම අලුත් කිරීමේදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා මිල ගනන් වැඩි වීම.
මුද්‍රණ ගාස්තු	750,000	798,354	(48,354)	6.44	ඌන වෙන් කිරීම 6.4% කි.

වෙනත්	305,000	376,720	(71,720)	23.51	පද්ධති විශ්ලේෂක තනතුර පුරප්පාඩු වීම නිසා තොරතුරු තාක්ෂණ ආයතනයේ සේවය ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම.
විශේෂ සේවා	550,000	669,000	(119,000)	21.63	2011.04.29 දිනැති අංක 4/2011 චක්‍රලේඛය අනුව වසර මැද කලමනාකරණ මණ්ඩල දීමනාව වැඩිවීම.
වෘත්තිය හා වෙනත්	350,000	477,758	(127,755)	36.50	2012.04.23 දිනැති අංක 8/2012 චක්‍රලේඛය අනුව පුහුණු වන කාර්මික විද්‍යාල ශිෂ්‍යයින් සඳහා ගෙවන දෛනික දීමනාව රු.150.00 සිට රු.500.00 දක්වා වැඩිවීම.
ශිෂ්‍ය සංවර්ධනය	200,000	205875	(5,875)	2.93	ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 2% ක වැඩිවීමකි.
උපාධි ප්‍රදානෝත්සව	1,600,000	1,780,695	(180,695)	11.29	වියදම් ශීර්ෂ කිහිපයක අපේක්ෂිත මුදලට වඩා වැඩි මුදලක් වැය වූ බැවින් වැය ශීර්ෂය ඉක්මවා ගොස් ඇති අතර මේ සඳහා අනුග්‍රාහක දායකත්වය ලැබී ඇත.
පාඨමාලා අත්පොත්	5,000,000	5,786,096	(786,096)	15.72	ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉන්දියානු මුද්‍රණය මිලදී ගැනීමට සැලසුම් කලත් පොත් කිහිපයක් ජාත්‍යන්තර මුද්‍රණය මිලදී ගැනීමට සිදුවීම නිසා ඇස්තමේන්තු ගත වැය ශීර්ෂය ඉක්මවා ගොස් ඇති අතර වැඩිපුර වැය වූ මුදල සිසුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.

විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි 2012 වර්ෂයේ සිට ආයතනයේ වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු ගත ආදායම් හා වියදම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කොට විචලතාවයන් අවම වන පරිදි වඩාත් තාත්වික පදනමක් යටතේ අයවැය ලේඛණය සකස් කිරීමට සටහන් කර ගතිමි.

5.4

(අ). විගණන වාර්තාවෙහි සඳහන් කොට ඇත්තේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වුවද වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත්තේ 2010 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවයි.

(ආ) අදාල වාර්ෂික වාර්තාව සකස් කරන විට ආරම්භ කරන ලද පාඨමාලා ලෙස අනපසුවී සටහන් වී ඇති අතර මෙම වරද 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කිරීමේදී නිවැරදි කර ඇත.

6. සටහන් කරගතිමි. මේ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කර අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.

ඔබගේ විමසුම සඳහා කරන ලද ඉහත දැක්වෙන සියළු පැහැදිලි කිරීම් නිවැරදි බවට මා විසින් පුද්ගලිකවම සහතික වෙමි.

මහාචාර්ය බී.සී.එන් පීරිස්
අධ්‍යක්ෂ
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

25/3/13

පිටපත්:-
ලේකම්,උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
සභාපතිති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
උප කුලපති,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, පේරාදෙණිය විශ්වවිද්‍යාලය